
# පරිගණකයක් මිලදී ගැනීමේදී දැනගත යුතු කරුණු

**අ ඔබ දැනටමත් පරිගණකයක හිමිකරුවෙක් වන්නට පුළුවන. නැතිනම් යථාකාලයේදී පරිගණකයක් මිලදී ගැනීමට අදහස් කරනවා විය හැකිය. එසේත් නොමැතිනම් ප්‍රමිතියක් නොමැති පරිගණකයක් මිලදීගෙන අමාරුවේ වැටුන අයකු වන්නට ද පුළුවන. මෙම ලිපි පෙළේ අරමුණ යම් අයකු පරිගණකයක් මිලදී ගැනීමට පෙර අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දීමයි.**

ජගත් වීරවර්ධන
තාක්ෂණ ශිල්පී මීඩියා ටෙක්නොලොජි පරිගණක ආයතනය



**LCD** හා **CRT** පරිගණක තිර

පසුගිය කලාපයෙන් අප දැනුවත් වූයේ පරිගණකයක් යනු කුමක්දැයි යන්නත් එහි ඇති විවිධ උපාංග පිළිබඳව සරලව හැඳැරීමත් ය. දේශීය වෙළෙඳපොළෙන් පරිගණකයක් මිලදී ගැනීමේදී සලකා බැලිය යුතු වැදගත් කරුණු පිළිබඳව මෙම ලිපියෙන් සලකා බලමු.

මේ සඳහා අප හමුවූයේ මීඩියා ටෙක්නොලොජ් පරිගණක ආයතනයේ තාක්ෂණ ශිල්පී ජගත් වීරවර්ධන මහතාසි. "කලකට ඉහතදී පරිගණකයක් යනු සුඛෝපභෝගී භාණ්ඩයක් වූවා. දැන් නම් අප රටේ පරිගණක වැහිවැහැලා. රුපියල් පන්දහසකටත් පරිගණකයක් මිලදී ගත හැකියි. මුලින්ම සිතිය යුතුයි තමත් පරිගණකයක් මිලදී ගන්නේ මූලිකවම කුමන කටයුත්තකටද කියා. තමන්ට අවශ්‍ය ලිපි ලේඛන සැකසීම පමණක් විය හැකියි. නැතිනම් පරිගණක ක්‍රීඩා කිරීම මූලික අරමුණ විය හැකියි. කෙසේ වෙතත් තමන්ගේ මූලික අරමුණ ගැන සිතනවා මෙන්ම අනාගතයේ කිරීමට අදහස් කරන කාර්යයන් පිළිබඳවත් අනිවාර්යයෙන්ම සැලකිලිමත් විය යුතුයි. යමෙකුට අවශ්‍ය ලිපි සැකසීමට පමණක් නම් පාවිච්චි කළ පෙන්ටියම් I පරිගණකයක් සෑහෙන මුත්, පරිගණක ක්‍රීඩා ආදිය සඳහා මෙවැනි අඩු ධාරිතාවයන්ගෙන් යුත් පරිගණක සුදුසු වන්නේ නැහැ. මෙහිදී සමහර පරිගණක ක්‍රීඩා කෙසේවත් ක්‍රියා නොකරන අතර සමහර ඒවා ඉතා මන්දගාමී ලෙස ක්‍රියා කරයි. දැන් අපි බලමු ලංකාවේ විකිණීමට ඇති එවැනි පරිගණක පද්ධතියන් දෙස. මෙවැනි පරිගණකයක් රුපියල් පන්දහසකට පමණ මිලදී ගත හැකියි.

14 Monitor
1.2 GB Hard Disk
Floppy Deive
32 MB RAM
Multimedia Kit

මෙහි සඳහන් ආකාරයට පරිගණක තිරයේ ප්‍රමාණය සෑහේ. නමුත් 32MB වැනි මතකයත් අද පවතින බොහෝ මෘදුකාංග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අවම ශාක්‍යතාවත් නැහැ. Photoshop-7 වැනි නවතම මෘදුකාංග හොඳින් ක්‍රියාත්මකවීමට අවම වශයෙන් 128 MB මතකයක්වත් අවශ්‍යයි. එසේම 1.2 GB දෘඩ තැටියකට (Hard Disk) නවතම මෙහෙයුම් පද්ධතියක් පවා ඇතුළත් කිරීමට ඉඩ මදියි. මෙවැනි අඩු ඉඩක් සහිත දෘඩ තැටිවලWindows 95 වැනි පැරණි මෙහෙයුම් පද්ධතියක් මෙන්මOffice වැනි මෘදුකාංග පමණක් හොඳින් ක්‍රියාත්මක වෙනවා. ඔබට මෙයින් පෙනී යනවා ඇති මෙවැනි අඩු ධාරිතාවකින් යුත් පරිගණකයකින් කළ හැකි කාර්යය ඉතා සීමිත බව. නමුත් ළමයකුට මිලදීගෙන දීමට ඉතා සුදුසු මෙවැනි අඩු මිල පරිගණකයි.


## අලුත්ම පරිගණක

දේශීය වශයෙන් පරිගණක මිලදී ගැනීමේ ක්‍රම කීපයක් තියෙනවා. පෙර සඳහන් කළ ආකාරයට පාවිච්චි කළ පරිගණක මිලදී ගැනීම එක් ක්‍රමයක්. නමුත් වඩාත් විශ්වාසනීය ක්‍රමය නම් ජනප්‍රිය වෙළෙඳනාමයක් යටතේ විදෙස්හිදී එකලස් කර මෙරටට ගෙන එන ලද පරිගණකයි.

මේවායේ සවිකර ඇත්තේ නියම උපාංග නිසා මෙම පරිගණක පිළිබඳව බොහෝ දුරට විශ්වාසය තැබිය හැකියි. එමෙන්ම මෙහි අඩංගුකර ඇති මෙහෙයුම් පද්ධතිය (Windows xp වැනි) නීත්‍යානුකූලව ලබාගත් එකක් නිසා බොහෝ පරිගණකවල දක්නට ලැබෙන විවිධ දෝෂයන් මෙහි දක්නට ලැබෙනුයේ ඉතා අඩුවෙන්.

| Chipset | I865PE | PT800 | 740 | 741 | KT266a | 746 | KT400 | 748 |
|---|---|---|---|---|---|---|---|---|
| North Bridge | 865PE | PT800 | SiS740 | SiS741 | VT8366A | SiS746 | VT8377 | SiS748 |
| South Bridge | 82801DB | PT800 | 962L | 964L | VT8235 | SiS963 | VT8235 | 963L |
| Processor | Pentium 4 | Pentium 4 | AMD Athlon XP / Athlon / Duron | AMD Athlon XP / Athlon / Duron | AMD Athlon XP / Athlon / Duron | AMD Athlon XP / Athlon / Duron | AMD Athlon XP | AMD Athlon XP / Athlon / Duron |
| Front Side Bus | 800 / 533 / 400MHz | 800 / 533 / 400MHz | 266 / 200MHz | 400 / 266 / 200MHz | 333 / 266 / 200MHz | 266 / 200MHz | 333 /266 / 200MHZ | 400Mhz |
| Memory | DDR 400 / DDR 333 / DDR 266 / Dual-DDR | DDR 400 / DDR 333 / DDR 266 / DDR 200 | DDR 266 / DDR 200 | DDR 400 | 2 X DDR 266 2 X SDR | DDR 333 / DDR 266 / DDR 200 | DDR 333 / DDR 266 | DDR 333 / DDR 266 |
| Max Memory | 4.0GB | 2.0GB | 1.0GB | 2.0GB | 2.0GB | 2.0GB | 3.0GB | 2.0GB |
| AGP Support | AGP 8X | AGP 8X | No | AGP 4X | AGP 4X | AGP 8X | AGP 8X | AGP 8X |
| IDE | ATA 100 | ATA 133 | ATA 133 | ATA 133 | ATA 133 | ATA 133 | ATA 133 | ATA 133 |
| Integrated VGA | No | No | Yes | No | No | No | NO | No |
| AC'97 | Yes | Yes | Yes | Yes | Yes | Yes | Yes | Yes |
| Integrated LAN | 10 / 100Mbps Ethernet | 10 / 100Mbps Ethernet | 10 / 100Mbps Ethernet | 10 / 100Mbps Ethernet | 10 / 100Mbps Ethernet | 10 / 100Mbps Ethernet | 10 / 100Mbps Ethernet | 10 / 100Mbps Ethernet |
| PCI Device/Slot | 3 PCI | 4 PCI | 3 PCI | 3 PCI | 5 PCI | 5 PCI | 5 PCI | 5 PCI |
| USB | 8 USB 2.0 | 6 USB 2.0 | 6 USB 2.0 | 6 USB 2.0 | 6 USB 2.0 | 6 USB 2.0 | 6 USB 2.0 | 6 USB 2.0 |
| Hyper Threading | yes | No | No | No | No | No | No | No |

ඉහත වගුවෙන් දැක්වෙන්නේ විවිධ වර්ගයේ මව් පුවරුව මත සවිකළ **Chipset** වර්ගයන් පිළිබඳව මෙන්ම එහි සවිකළ හැකි මතක කාඩ්පත් හා **VGA** කාඩ්පත් වැනි උපාංග ගැන විස්තරයකුයි. මෙම වගුව හොඳින් අධ්‍යනය කිරීමෙන් පහසුකමින් වැඩි මව් පුවරු ගැන යම් අවබෝධයක් ලබාගත හැකියි.



පෙන්ටියම් IV වර්ගයේ මව් පුවරුවක්

එමෙන්ම මෙවැනි පරිගණකයක් මිලෙන් ඉහළ අතර පෙන්ටියම් IV පරිගණකයක මිල රුපියල් ලක්ෂයකට වඩා වැඩි වෙනවා.

ලංකාව තුළ වඩාත් ජනප්‍රියතම ක්‍රමය නම් විදෙස්හි නිපදවූ පරිගණක කොටස් මෙරටේදී එකලස් කර නිපදවන පරිගණකයි. මෙහිදී ඇති වාසිය නම් තමන්ට අවශ්‍ය උපාංග මොනවාදැයි තමන්ටම තෝරා ගැනීමට ඇති හැකියාවයි. මෙම උපාංග සඳහා යම්කිසි කාල සීමාවකට යටත්ව වගකීමේ සහතිකයක් හිමිවන නිසා මෙවැනි පරිගණකයක් විශ්වාසවන්තව මිලදී ගත හැකියි.

පරිගණකයක් මිලදී ගැනීමේදී එයට එක් කළ යුත්තේ කුමන උපාංගද එසේම එම උපාංග පිළිබඳව යම් දැනුමක් ලබා තිබීමද ඔබට වැදගත් වේවියැයි සිතූ නිසා මෙවර ලිපියෙන් එම උපාංග පිළිබඳව යම් අවබෝධයක් ලබාදීමට අදහස් කරනවා.

අපි මුලින්ම බලමු දැනට වෙළෙඳපොළේ ඇති එකලස් කළ පෙන්ටියම්III පරිගණකයක් දෙස.

මෙහි

1000 MHZ Processor
15 " Digital Monitor
20GB Hand disk
64 MB RAM
8MB VGA Card

Multimedia Kit යන උපාංග අඩංගු වෙනවා.

මෙවැනි පරිගණකයකින් බොහෝ පරිගණක මෘදුකාංග ක්‍රියාත්මක වුවත්, මෙහි අඩංගුකර ඇති සමහර උපාංගවල ඇති ධාරිතාව Photoshop 7 – 3 D MAX, MAYA වැනි නවතම මෘදුකාංග ක්‍රියාත්මක වීම සඳහා සෑහෙන්නේ නැහැ. විශේෂයෙන්ම මෙහි ඇති මතකය(RAM) නවතම මෙහෙයුම් පද්ධතිය වන Windows XP සඳහා ද අනුකූලතාවයක් දක්වන්නේ නැහැ. එමනිසා අවම වශයෙන් 128 MB ධාරිතාවයක් ඇති කාඩ් පතක් සවිකරවා ගත යුතුයි.

එමෙන්ම 8MB VGA කාඩ් පතේ ධාරිතාවය ද 3D පරිගණක ක්‍රීඩාවන් සඳහා ද යෝග්‍ය නොවන නිසා 32 MB ධාරිතාවයක් සහිත 3 - D සඳහා අනුකූලතාවයක් දක්වන කාඩ්පතක් තෝරාගත යුතුයි. අනෙකුත් උපාංග වෙනසක් කිරීමට අවශ්‍ය වන්නේ නැහැ. මෙවැනි පරිගණකයක් රු. 35000 කට පමණ මිලදී ගත හැකියි.

පෙන්ටියම් IV පරිගණකයක් මිලදී ගැනීමේදී වඩාත් සැලකිල්ලක් දැක්විය යුතු වෙනවා. ප්‍රොසෙසරයේ වේගයට සුදුසු උපරිම ධාරිතාවයෙන් යුතු උපාංග තෝරා ගැනීමෙන් එහි උපරිම කාර්යක්ෂමතාව ලබා ගත හැකි වෙනවා.

## ප්‍රොසෙසරය Processor

පරිගණකයක් මිලදී ගැනීමේදී සලකා බැලිය යුතු වැදගත් දෙයනම් එහි ප්‍රොසෙසරයේ වේගය පිළිබඳවයි. පෙන්ටියම් III කාණ්ඩයේ 1000 MHZ සිට 1700 MHz දක්වා වේගයවත් ප්‍රොසෙසර් දැන් වෙළෙඳ පොළේ දක්නට ලැබෙනවා.

නමුත් මෙම පෙන්ටියම් III ප්‍රොසෙසර අභිබවා පෙන්ටියම් IV අප රටේ ජනප්‍රියත්වයත් ලබා ගෙන තිබෙනවා. ඉතාමත් වේගයෙන් වැඩ කිරීමට හැකියාවක් ඇති නවතම තාක්ෂණික ක්‍රම (Hyper - Threading වැනි) භාවිතා කිරීම නිසා3D MAX, MAYA වැනි ත්‍රිමාන මෘදුකාංග භාවිතයේදී ඉතා වේගයෙන් ක්‍රියාත්මක වෙනවා. මෙහි නවතම ප්‍රොසෙසරයේ වේගය 3.20GHZ පමණ වෙනවා.

මෙම ප්‍රොසෙසර වර්ගය මෙන්ම ජනප්‍රියත්වයට පත්වෙමින් පවතින වර්ගයක් නම් AMD නැමති ප්‍රොසෙසර වර්ගයයි. AMD, Athlon XP Doron යන වර්ගයන් මෙරට ජනප්‍රියතම වර්ග කීපයක්. රූපමය කටයුතු (GRAPIHIC) සඳහා බෙහෙවින් සුදුසුවන මෙම ප්‍රොසෙසර Intel සමාගමේ පෙන්ටියම් ප්‍රොසෙසරවලට සාපේක්ෂව මිලෙන් අඩුයි. Celeron නමැති මිලෙන් අඩු වර්ගයක් ද ඇති අතර මෙයට එතරම් ඉල්ලුමක් ඇත්තේ නැහැ.

## මව් පුවරු MOTHER BORD

ප්‍රොසෙසරය වගේම ඉතා සැලකිල්ලෙන් තෝරාගත යුතු උපාංගය නම් මව් පුවරුවයි. මක්නිසාදයත් ප්‍රොසෙසරය මෙන්ම අනිකුත් බොහෝ උපාංගද සවිවන්නේ මව් පුවරුව මත වීම නිසයි. මව් පුවරුව මෙන්ව ප්‍රොසෙසරය ද එක්වර එකම තැනකින් මිලදී ගත යුතුයි. ඒ ප්‍රොසෙසරයට සරිලන මව් පුවරුවක් මිලදී ගත යුතු බැවිනි.

මෙම පුවරුද විවිධ වර්ගයන්ගෙන් හා විවිධ වෙළඳ නම් යටතේ විකිණීමට තිබෙනවා. ඒ පිළිබඳව එතරම් සැලකිල්ලක් දැක්විය යුතු නැති නමුත් එහි සවිකල 'Chipset' වර්ගය මෙන්ම එහි වේගය ගැන ද සැලකිල්ලක් දැක්විය යුතුයි. Intel, VIA, SIS නැමති 'Chipset' වඩාත් ජනප්‍රිය වර්ගයන් වේ.

බොහෝ නවීන මව් පුවරු මතම VGA හාSound card යනාදිය සවිකර තිබෙනවා. මෙහි ඇති වාසි මෙන්ම අවාසි ද තියෙනවා. වෙනම කාඩ්පත් මිලදී ගැනීමට අවශ්‍ය නොවීම වාසියක් වන අතර යම් විටකදී එම කාඩ්පත් අක්‍රිය වුවහොත් මුළු මව් පුවරුවම ඉවත දැමීමට සිදුවීම අවාසියකි. නමුත් VGA හාSound කාඩ් සම්බන්ධ කිරීමට අමතර Slots මව් පුවරුව මත ඇත්නම් මේ පිළිබඳව සිතිය යුතු නැහැ.

මව් පුවරුවක් තෝරා ගැනීමේදී එයට සවිකෙරෙන මතක කාඩ්පත් වර්ගය කුමක්දැයි විමසා බැලිය යුතුයි. නවීන පෙන්ටියම් IV සඳහා සුදුසු මව් පුවරු මත වර්ග කීපයක කාඩ්පත් සවිකළ හැකියි. නමුත් සමහර මව් පුවරු මත සවිකළ හැක්කේ එක් වර්ගයක් පමණක් වීම නිසා කල්පනාකාරී වන්න. එමෙන් ම USB 2, TV OutPut, DVI OUT PUT මෙන්ම DDR RAM සඳහා අනුකූලතාවයක් දක්වන මව් පුවරුවක් මිලදී ගැනීමට උත්සුක වන්න.



විවිධ වර්ගයේ පරිගණක ආවරණ

## ග්‍රැෆික් කාඩ් (VGA Card)

පරිගණකය හා තිරය අතර දත්ත හා රූප හුවමාරුවන්නේ මෙම ග්‍රැෆික් කාඩ්පත ආධාරයෙන්ය. මෙම කාඩ්පත් සමහර මව්පුවරු මත සවිකර ඇති අතර වෙනමද සම්බන්ධ කළ හැකියි. කාඩ්පතක් තෝරා ගැනීමේදී අවම වශයෙන්32MB ධාරිතාවයක් ඇති ත්‍රිමාන (3-D) හා DVI සඳහා අනුකූලතාවයක් දක්වනDDR මතකයක් ඇති කාඩ්පතක් තෝරා ගන්න.


## මතකය (Memory)

පරිගණකයක් තුළ මතකය විවිධ අයුරින් ක්‍රියාත්මක වන බව පසුගිය කලාපයේදී සඳහන් කළා. අප මෙහිදී මතකය යනුවෙන් අදහස් කරන්නේRendom Memory යනුවෙන් හඳුන්වන මතක කාඩ්පත්Memory Card සම්බන්ධවයි. මෙමරි කාඩ්පත්ද වර්ග කිපයක් දක්නට ලැබෙනවා. පෙන්ටියම් III පරිගණක සඳහා බෙහෙවින් භාවිතා කරන Dimms-PC-133 MHz වේගයන් සහිත කාඩ්පත්ද පෙන්ටියම් IV මව් පුවරු සඳහා භාවිතාවනDDR හා SD නැමති නවීන මතක කාඩ්පත් ද ඉන් කිපයක් පමණි.


මුල් කාලයේ පෙන්ටියම් I, II වැනි පරිගණක සඳහා භාවිතා කළේ PC-66-5D වැනි මතක කාඩ්පත් වර්ගයන්ය. පසු කාලයේදී පෙන්ටියම් III පැමිණීමත් සමගම133 MHzවේගයක් සහිත RD RAM ජනප්‍රිය වූවා. නමුත් දැන් පෙන්ටියම් IV සඳහා දRD RAM භාවිතා කරන නමුත් වඩාත් සුදුසු වන්නේ ඉහළ වේගයක් ඇති DDR හෝ SD කාඩ්පත් ය. මව් පුවරුවක් මිලදී ගැත්මේදී එයට සවිකළ හැක්කේ කුමන කාඩ්පත් වර්ගයද යන්න සඳහන් කර ඇති නිසා අත්පොතේ සඳහන් වර්ගයම ඳලදී ගන්න. එමෙන්ම පරිගණකයෙන් කාර්යක්ෂමව හා වේගවත්ව වැඩ කිරීමට සෘජුවම මතකයේ ධාරිතාව බලපාන නිසා ඉහළ අගයක් ඇති (256 MB වැනි) කාඩ්පතක් තෝරා ගැනීමට සැලකිලිමත්වන්න.

## මොඩෙම් (MODEM)

අන්තර්ජාලය හා සම්බන්ධ වීමට මොඩෙම් නම් උපකරණය නැතිවම බැරිය. මේවා දෙයාකාරයකින් සමන්විත වෙනවා. එනම් මව් පුවරුවට සවිකරනInternat Modem හා බාහිරව සවිකරනExternal Modem යන වර්ගයන් ය. මෙයින් අභ්‍යන්තර මොඩෙම් වර්ගය මිලෙන් අඩු නිසා බොහෝ අය භාවිතා කරන්නේ මෙම වර්ගයයි. මා ඔබට නිර්දේශ කරන්නේ 56 Kbs වේගයන් සහිත අභ්‍යන්තර මොඩෙම් වර්ගයයි.



ආවරණය තුළ මව් පුවරුව හා අනෙකුත් උපාංග සවිකර ඇති අන්දම



රැහැන් රහිත යතුරු පුවරුවක් හා මවුසියක්

## දෘඩ තැටිය (HARD DISK)

මුල් කාලයේ පරිගණක සඳහා 1.2 GB වැනි අඩු ධාරිතාවයක් සහිත දෘඩ තැටි නිපදවූවත්, ධාරිතාවයෙන් වැඩි මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති බිහිවීමත් සමගම මෙයට සරිලන ලෙසද ධාරිතාවයද වැඩි දෘඩ තැටි නිපදවීමට නිෂ්පාදකයන් පෙළඹුනා. දැන් ජනප්‍රිය 30 GB ධාරිතාවයක් ඇති දෘඩ තැටියි. පරිගණකයකට විදුලිය සැපයූ මොහොතේ පටන් දෘඩ තැටිය වේගයෙන් කැරකැවෙමින් පවතිනවා. ප්‍රොසසරයේ වේගය, මව් පුවරුවේ වේගය, මතකය යන ඒවා වේගවත් වුවත් දෘඩ තැටිය කැරකැවෙන වේගය අඩු නම් ඔබ පතන නියම කාර්යක්ෂමතාව පරිගණකයකින් ලබා ගත නොහැකියි. එම නිසා නවීන දෘඩ තැටි ඉතා වේගවත් ලෙස ක්‍රියා කරන ලෙස නිපදවා තිබෙනවා. එම නිසා අවම වශයෙන් 7200 RPM වේගයක් සහිත දෘඩ තැටියක් තෝරා ගන්න.

## ආවරණ (PC – CASE)

ඉහත සඳහන් කළ සියලුම උපාංග සවිවන්නේ පෙට්ටියක් වැනි මෙම ආවරණය තුළයි. මෙම ආවරණයත් මිලදී ගැනීමේ බලසැපයුම් ඒකකය(Pomer Supply Unit) ඇතුළු ඇත මුරුච්චි ද ලැබෙනවා. දැන් පරිගණක සඳහා භාවිතා වන්නේ ATX නමැති වර්ගයයි. පෙන්ටියම් IV පරිගණක සඳහා වෙනමම ආවරණ වර්ගයක් ඇති නිසා ඒ පිළිබඳව කල්පනාකාරී වන්න.

## තැටි ධාවකය (CD ROM)

මුල් කාලයේ පරිගණක දත්ත හුවමාරුවේදී භාවිතා වූයේFloppy Disk පමණයි. CD Rom භාවිතයට පැමිණීමත් සමගම දත්ත හුවමාරුව වැනි අංශයන්ට සීමාවී තිබූ පුද්ගල පරිගණක සිනමාපට නැරඹීම, සංගීතය ඇසීම මෙන්ම පරිගණක ක්‍රීඩාවන් වැනි අංගයන් දක්වා පුළුල් වූවා. එමෙන්ම වැඩි ධාරිතාවයක් ඇති මෙහෙයුම් පද්ධති මෙන්ම මෘදුකාංග දියත් කිරීමට ද මෙම සංගත තැටි ධාවකයන් බොහෝ උපකාරී වුනා. මුලදී කියවීමට පමණක් සීමාවී තිබූ මෙම ධාවකයන් දැන් DVD තැටි නැරඹීමට මෙන්ම පටිගත කිරීමට හැකි ලෙසද නිපදවා තිබෙනවා. ඔබේ පරිගණකය සඳහා සුදුසුවන්නේ උපරිම කියවීමේ, ලිවීමේ හා නැවත ලිවීමේ හැකියාවන් ඇති CD- CRW ධාවකයක් මිලදී ගැනීමයි.

## බහු මාධ්‍ය MALTIMEDIA

පරිගණකයට නැතිවම බැරි උපාංගයක් නම් බහු මාධ්‍ය උපාංගයි. මෙයට තැටි ධාවකය, ශබ්දවාහිනී කට්ටල, ශබ්දවාහිනී කාඩ්පත් (Sound Card) යනාදිය ඇතුල් වෙනවා. මේ සඳහා Sub- Woofor සහිත ශබ්දවාහිනී කට්ටලයක් මිලදී ගැනීමෙන් සිනමාපට නැරඹීමේදී ඉතා උසස් රසාස්වාදයක් ලබා ගැනීමට හැකිවෙනවා. යතුරුපුවරු මෙන්ම මවුසයද දැන් වයර් රහිත තාක්ෂණයෙන් එළිදක්වා තිබෙන නිසා ඔබේ රුචිකත්වය අනුව මෙවැනි උපාංග තෝරා ගැනීමේ නිදහස ඔබ සතුයි.

## වගකීමේ සහතිකය

මෙතෙක් මා දැනුවත් කළේ ඔබ අලුතෙන් පරිගණකයක් මිලදී ගැනීමේදී එයට සවිකළ යුතු උපාංග පිළිබඳව සරල විස්තරයක්. එමෙන්ම සලකා බැලිය යුතු වැදගත්ම කාරණය නම් ඔබ පරිගණකය මිලදී ගන්නා ආයතනය ඔබේ පරිගණකයට ලබා දෙන වගකීමේ සහතිකය පිළිබඳවයි. බොහෝ ආයතන එහි අඩංගු උපාංග පිළිබඳව වසරක වගකීමකුත් සේවා කටයුතුත් නොමිලේ කිරීම සඳහා වසර තුනකුත් ලබා දෙනවා. නමුත් සමහර ආයතන මෙම වගකීම පැහැර හරින බවට බොහෝ විට චෝදනා නැගෙනවා. එම නිසා ඒ පිළිබඳව දැඩි සැලකිල්ලක් දක්වා විශ්වාසනීය ආයතනයකින්ම පරිගණකයක් මිලදී ගැනීමෙන් පසුව ඇතිවන චිත්ත පීඩා හා සිදුවන අපහසුතාවහත්ගෙන් මිදිය හැකියි.

❑

**මොහාන්**